ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 76 දරන
# ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජනවාරි මස 01 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 76 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 88/80

## 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 76 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 45 දරන ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි (ආ) ඡේදය වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 45 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) පහත දක්වෙන නිල බලයෙන් සාමාජිකයන් වන්නා වූ එනම් :—

(i) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති ;

(ii) රබර් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ;

(iii) පොල් පර්යේෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ;

(iv) කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ සභාපති ;

(v) තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ ;

(vi) ආයතනයේ අධ්‍යක්ෂ ; සහ

(vii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරන ලද යම් විශ්ව විද්‍යාලයක නියෝජිතයෙක් ;".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ආයතනයේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික හා වියදම් ප්‍රතිපූරණය.

12. ආයතනයේ සාමාජිකයන්ට රැස්වීම්වලට සහභාගිවීම සඳහා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික යන් ගෙවනු ලැබිය යුතුය. ආයතනයේ රැස්වීම්වලට සහභාගිවීමේ කාර්යය සඳහා හෝ ආයතනය විසින් අනුමත කරනු ලබන ආයතනයේ කටයුතුවලට සම්බන්ධ වෙනත් කාර්ය සඳහා හෝ ආයතනයේ සාමාජිකයන් විසින් දරන ලද ගමන් වියදම්, හෝටල් ගාස්තු සහ අනියම් වියදම් ආයතනය විසින් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය